**වාහන ආදායම් බලපත්‍රයක් නිකුත් කිරීම**

1. ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ( මුල්පිටපත නැති විටකදී එම්.ටී.ඒ.11 ආකෘති පත්‍රය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයෙකුගේ නිළ මුද්‍රාව සහ අත්සන සහිතව ඉදිරිපත් කල යුතුය)
2. කල් ඉකුත් නොවූ රක්ෂණ සහතිකය
3. විකෘති /අබලන්/අපැහැදිලි නොවූ රියදුරු බලපත්‍රය
4. පසුගිය වර්ෂයේ ආදායම් සහතිකය
5. පහසු ගෙවීමේ ක්‍රමයට ලබාගත් වාහනයක් නම් අදාල මුල්‍ය ආයතනයෙන් සහතික කල මාස 3 ක් ඉකුත් නොවූ ලියාපදිංචි සහතිකයේ පිටපතක්
6. වායු විමෝචන සහතිකය
    1. ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත
    2. ආයතනයේ නිළ මුද්‍රාව යෙදූ අත්සන සහිත සහතිකය
    3. ලොරි, මෝටර් කෝච් සඳහා යෝග්‍යතා සහතික
    4. වායු විමෝචන සහතිකය

**මාර්ගස්ථ මගී ප්‍රවාහන බස්රථ සඳහා (ඔම්නි බස්රථ /මෝටර් කෝච්)**

I.පළාත් සභාවේ අනුමත ස්ථාන වලින් අදාල වර්ෂය සඳහා මාස 2 ක් ඇතුලත ලබාගත් යෝග්‍යතා සහතිකය (රිසිට්පත සමග)

II.අදාල වර්ෂය සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් නිකුත් කල මගී ප්‍රවාහන අවසර පත්‍රය (ඡායා පිටපතක් සමග)

**නිදහස් වාහන සඳහා**

ඉහත අවශ්‍යතා සියල්ල සපුරා ඇති විටදී ආදායම් බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

**අදාල වර්ෂයේ ආදායම් බලපත්‍රය අස්ථාන ගතවූ විටකදී**

1. මාස 6 ක් කල් ඉකුත් නොවූ පොලිස් වාර්ථාවක්
2. ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත
3. කල් ඉකුත් නොවූ රක්ෂණ සහතිකය
4. පොලිස් වාර්තාව ලබාගත් දිනයේ සිට ඉතිරි මාස සඳහා අදාල බලපත්‍ර ගාස්තුව
5. වායු විමෝචන සහතිකය